# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1842/11 - 2013 දෙසැම්බර් මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2013.12.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරවරයාගේ ප්‍රකාශනයයි

මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර ටිකිරි බණ්ඩා කොබ්බෑකඩුව වන මම 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ආ) ව්‍යවස්ථාවේ 8(ආ) ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව දෙදහස් දහතුන වර්ෂයේ දෙසැම්බර් මස 06 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මධ්‍යම පළාත් සභාවේ හයවන සභාවේ පළමුවන සැසිවාරය අවසන් කරනු ලබන බැව් මෙයින් දැනගත යුතුයි.

එකී ව්‍යවස්ථාවේ 08(අ) ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව යථෝක්ත සභාව වර්ෂ දෙදහස් දාහතරක් වූ ජනවාරි මස 29 වෙනි බුධ දින පෙරවරු 10.00ට, පල්ලේකැලේ පළාත් සභා පරිපාලන සංකීර්ණයේ නව පළාත් සභා ගර්භයේදී නැවත රැස්වන පරිදි කැඳවන බව මෙයින් දැනගත යුතුය.

ටිකිරි බණ්ඩා කොබ්බෑකඩුව,<br>
මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර.

වර්ෂ දෙදහස් දහතුනක්වූ දෙසැම්බර් මස 05 දින<br>
මහනුවරදී අත්සන් කරන ලදී.

01 - 310

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - PG 1887 — 160 (2013/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*